**මදුරාවල ප්‍රාදේශීය සභාව**
**කළුතර දිස්ත්‍රික්කය**
**-------------------**

**1.** මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**--------------------------------**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 25 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 සැප්තැම්බර් 30 දින ද සභාපතිවරයාට යවා ඇත**.**

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මදුරාවල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2017 වර්ෂයේදී රු.1,919,489 ක වියදමින් ඉදිකර තිබූ කොම්පෝස්ට් අංගනය ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසානයට හියුම් පයිප්ප තොග ශේෂය රු.45,720 කින් අඩුවෙන් සහ වියදම රු.45,720 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | කොම්පෝස්ට් අංගනය අළුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය සඳහා දරා ඇති වියදම් ගිනුම්ගත කිරිමේදි කර්මාන්ත ණයහිමි වටිනාකම රු.207,272 ක් වැඩියෙන් හා සමුච්චිත අරමුදල් ගිණුම රු.207,272 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | 2018 දෙසැම්බර් 31 දිනට බුලත්සිංහල ප්‍රාදේශිය සභාවෙන් ලැබිය යුතු රු.2,853,309 ක මුදල මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබූ අතර බුලත්සිංහල ප්‍රාදේශිය සභාවට ගෙවිය යුතු මුදලක් ලෙස රු.221,804 ක් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | පළාත් පාලන සහකාර කොමසාරිස් මගින් බුලත්සිංහල ප්‍රාදේශිය සභාවෙන් ලැබිය යුතු , ගෙවිය යුතු ශේෂ සංශෝධනය කිරිමට අනුමැතිය ලබා ගෙන සංශෝධනය කරමි. |
| (v) | කොම්පොස්ට් අංගනයේ අප ජල පද්ධතිය සකස් කිරිමේ කර්මාන්තයේ ප්‍රාග්ධන වියදම හා ණයගිමි වටිනාකම රු.170,036 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතු වේ. | ඉදිරි ගිණුම් මගින් නිවැරදි කරමි. |

(ආ) නොසැසඳුණු ගිණුම්

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන් දිමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.54,838,609 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාළ ශේෂයන් ඒවාට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.11,808,538 ක වෙනසක් නිරීක්ෂණය විය. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරිමට කටයුතු කල යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරිමට කටයුතු කරන බව දන්වමි. |
| (ii) | මූල්‍ය ප්‍රකාශනවලට අනුව ඉඩම් ගොඩනැගිලි වටිනාකම රු.157,966,405 ක් වූ නමුත් ඊට අදාල උපලේඛනයේ වටිනාකම් දක්වා නොතිබීම හේතුවෙන් ගිණුමේ ශේෂය හා උපලේඛනයේ ශේෂය සැසඳිමට නොහැකි විය. | ඉඩම් ගොඩනැගිලි වටිනාකම ප්‍රත්‍යාගණනය කර වටිනාකම් ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් කල යුතුවේ. | ඉඩම් ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කර ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කරමි. |
| (iii) | | | |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය හා සමීක්ෂණ මණ්ඩල වාර්තා නොමැතිවීම නිසා එකතුව රු.159,536,122 ක් වූ ගිණුම් විෂයයන් 05 ක් විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතුවේ. | ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන සමඟ සාක්ෂි ඉදිරිපත් කරමි. |

1.4 අනුකූල නොවීම

------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූලනොවීම

----------------------------------------------------------------------------

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ<br><br>(i) 134(1) වගන්තිය | - | දියුණු කළ ප්‍රදේශ වශයෙන් ප්‍රාදේශීය සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශ ඇතුළත පිහිටියා වූ නිශ්චල දේපලවල වරිපනම් බදු සඳහා නව හඳුනාගැනීමක් සිදු කර නොතිබුණි. | ප්‍රාදේශිය සභා පනත අනුව කටයුතු කල යුතුවේ. | ඉදිරියේදී පනත අනුව කටයුතු කරමි. |
| | (ii)154(1) වගන්තිය | 549,695 | කට්ටිකර විකිණූ ඉඩම් දෙකකින් සියයට එකකට සමාන බද්ද අයකර නොතිබුණි. | ප්‍රාදේශිය සභා පනත අනුව කටයුතු කල යුතුවේ. | ඉදිරියේදී පනත අනුව කටයුතු කරමි. |
| | (iii) 160 වගන්තිය | 313,574 | හිඟ වරිපනම් බදු අය කර ගැනීමේ අවසන් පියවර ලෙසට දේපළ තහනම් කිරීම් කර නොතිබුණි. | ප්‍රාදේශිය සභා පනත අනුව කටයුතු කල යුතුවේ. | ඉදිරියේදී පනත අනුව කටයුතු කරමි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | 157,966,405 | සභාව සතු සියලු ඉඩම් ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් හෝ පරීක්ෂා කිරීමකට ලක් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | රීති ප්‍රකාරව කටයුතු සිදු කරමින් පවති. |
| (ඇ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ | | | | |
| | 3.9.1 වගන්තිය | 604,471 | සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ සුදුසුකම් පරීක්ෂා කිරීමකින් තොරව ප්‍රජාපාදක | චක්‍රලේඛවලට අනුගත විය යුතුවේ. | ඉදිරියේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කරමි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | සමිතිවලට කොන්ත්‍රාත් පවරා තිබුණි. | | |
| (ඈ) | 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | | වරිපනම්වලට යටත් වන, දේපළ වසර 05 කට වරක් තක්සේරු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු සිදු කරමින් පවති. |
| (ඉ) | 2017 දෙසැම්බර් 29 දිනැති අංක 2052 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය. | 77,250 | ප්‍රචාරක දැන්වීම් පුවරු 30 කින් අයවිය යුතු ගාස්තු අයකර ගෙන නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | ඉදිරියේදී නිවැරදිව ගාස්තු අය කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,262,899 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,937,048 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,322,992 | 1,408,443 | 1,084,556 | 524,229 | 1,585,450 | 1,411,620 | 1,285,106 | 213,883 |
| (ii) | බලපත්‍ර ගාස්තු | 333,500 | 245,450 | 356,741 | - | 325,550 | - | 313,940 | - |
| (iii) | වෙනත් ආදායම් | 14,635,930 | 10,500,000 | 9,163,990 | 22,852,583 | 13,627,600 | 10,500,000 | 11,928,359 | 17,255,583 |

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය

(අ) වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් හිඟය රු.369,666 ක් වූ අතර 2019 අප්‍රේල් 30 වන විට ඉන් රු.103,280 ක් හෙවත් සියයට 28 ක් අය කරගෙන තිබුණු ප්‍රධාන කාර්යාලයේ වරිපනම් බදු හිඟයෙන් වසර 03 කට වඩා පැරණි හිඟ රු.91,713 ක් විය | හිඟ වරිපනම් ආදායම අයකර ගත යුතුවේ. | හිඟ වරිපනම් ආදායම රැස් කිරීමට කටයුතු කරමි. |

(ආ) උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) උසාවි දඩ | | |
| සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟහිටි උසාවි දඩ මුදල රු.4,897,583 ක් වූ අතර එම හිඟ ශේෂයෙන් වර්ෂය තුල රු.3,000 ක් පමණක් ලැබී තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා රු.500,000 ක් බිල් කර තිබූ අතර, 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.5,394,583 කි. | හිඟ ආදායම් අය කර ගත යුතුවේ. | රු.5,394,533 ක් වූ හිඟ මුදලින් රු.818,988 මුදලක් 2019 පෙබරවාරි 08 දිනය වන විට අය කර ඇත. |
| (ii) මුද්දර ගාස්තු | | |
| සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟහිටි මුද්දර ගාස්තු මුදල රු.12,358.000 ක් වූ අතර එම හිඟයෙන් වර්ෂය තුළ කිසිඳු මුදලක් ලැබී නොතිබුණි. වර්ෂයට අදාල බිල් කිරීම රු.10,000,000 ක් වූ අතර එම මුදලින් රු.4,900,000ක අත්තිකාරමක් පමණක් වර්ෂය තුළ ලැබී තිබුණි. | හිඟ ආදායම් අය කර ගත යුතුවේ. | රු.249,406 ක හිඟ ආදායම් ලබා ගැනීම සඳහා පලාත් ආදායම් දෙපාර්තමේන්තුවට උපලේඛන යවා ඇති අතර ඉතිරි මුදලක් අය කර ගැනීමට උපලේඛන සකස් කරමින් පවතී. |

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) අතුරු ව්‍යවස්ථා | | |
| ප්‍රාදේශිය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 16 ක් ඉටු කිරිම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් සභාව විසින් ප්‍රධාන කාරණා 12 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන තිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කලයුතු වේ. | පනවා තිබු අතුරු ව්‍යවස්ථා සම්බන්ධයෙන් පැහැදිලි කිරිම් කර ඇත. |
| (ආ) ක්‍රියාකාරි සැලැස්ම | | |
| (i) 2018 වර්ෂය තුල සකස් කරන ලද ක්‍රියාකාරි සැලැස්ම තුල එම ක්‍රියාකාරකම් වල ප්‍රගතිය මැන බැලීමේ ක්‍රමවේදයක් නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | ඉදිරියේදි නිවැරදිව කටයුතු කරමි |
| (ii) වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් වෙන්කරන ලද පුනරාවර්තන හා ප්‍රාග්ධන පිරිවැය රු.මි.79.8 ට අදාලව අක්මුදල් සැලැස්මක් සකස් කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | ඉදිරියේදි නිවැරදිව කටයුතු කරමි. |
| (iii) ක්‍රියාකාරි සැලැස්ම තුල ඇතුළත් පිරිවැය රු.4,765,000 ක් වූ ව්‍යාපෘති 15 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | ඉදිරියේදි නිවැරදිව කටයුතු කරමි. |
| (ඇ) තිරසර සංවර්ධන ඉලක්ක | | |
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව සිටියත් , එම අරමුණු සඳහා නව ගෝලීය දර්ශක තුලින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා 2018 දෙසැම්බර් 31 දින දිගු කාලීන සැලසුම් සකස් කර නිශ්චිතව වගකීම් පවරා නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ලඟා කර ගැනිමට දිගු කාලීන සැලසුම් සකස් කර නිශ්චිතව වගකිම් පැවරිය යුතුවේ. | තිරසර සංවර්ධන 2030 න්‍යාය පත්‍රය පිළිබඳ දැනුවත් විමෙන් පසුව තිරසර සංවර්ධන සැලැස්ම 2019 වර්ෂයේදී පිළියෙල කර ඇත. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතු කැබ් රථය සම්බන්ධයෙන් 2016 වර්ෂයේදී සිදු වූ රිය අනතුරට අදාලව දෙහිවල ගල්කිස්ස යාන්ත්‍රික ඉංජිනේරුවරයා විසින් තක්සේරු කරන ලද මූල්‍ය හානිය රු.1,134,037 ක් වගකිව යුතු අයගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මූල්‍ය හානිය වගකිව යුතු අයගෙන් අය කල යුතු වේ. | වගකිව යුත්තන් නිශ්චය කිරිම සඳහා ඉදිරි ක්‍රියා මාර්ග ගතයුතු ආකාරය පිළිබඳ පළාත් පාලන කොමසාරිස්ගෙන් උපදෙස් ඉල්ලා ඇත. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත | | |
| (i) පුරප්පාඩුව පැවති ලේකම් තනතුරේ වැඩ ආවරණය සඳහා කළමනාකරණ සහකාර 1 ශ්‍රේණියේ නිලධාරිණියක 2017 ජූනි මාසයේ සිට පත්කර තිබුණි. | ලේකම් තනතුර සඳහා කළමනාකරණ අධි ශ්‍රේණියේ නිලධාරියෙකු බඳවා ගත යුතුවේ. | කාර්ය මණ්ඩල තොරතුරු ඉදිරිපත් කිරිමේ කාර්තු වාර්තාවේදී පුරප්පාඩු පෙන්නුම් කර ඇත. |
| (ii) සභාවේ පුස්තකාලාධිපති තනතුරු 01 ක්,ආදායම් පරීක්ෂක තනතුරු 02 ක්, සෞඛ්‍ය පරිපාලක සහ රියදුරු එක් තනතුර බැගින්ද, කාර්යාල කාර්ය සහායක 04 දෙනෙකුද,මුරකරුවන් දෙදෙනෙකුද ,පුස්තකාල සහායක එක් තනතුරක් හා පෙර පාසැල් ගුරු තනතුරු 02 ක් සහ ක්ෂේත්‍ර කම්කරු දෙදෙනෙකුගේ පුරප්පාඩු පැවතිණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගතයුතුවේ. | ඉදිරියේදි බඳවා ගැනිමට කටයුතු කරමි. |
| (ආ) සේවක ණය | | |
| විශ්‍රාම ගිය හා ස්ථාන මාරු වී ගිය නිලධාරින් තිදෙනෙකුගෙන් රු.85,750 ක ණය ශේෂයක් වසර ගණනාවක සිට අයකර ගෙන නොතිබුණි. | හිග ණය ශේෂ අයකර ගත යුතුවේ. | අය කර ගැනිමට කටයුතු කරමි. |

3.4 කොන්ත්‍රාත් පරිපාලනය

-----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ඉදි කර තිබූ රු.3,104,471 ක් වටිනා කර්මාන්ත 04 කින් කර්මාන්ත 02 ක් සඳහා නිර්මාණ සකස් කර අනුමැතිය ලබාගෙන නොතිබුණ අතර, අනෙක් කර්මාන්ත 02 සඳහා නිර්මාණ සකස් කර තිබුණ ද සහා අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ව්‍යාපෘති ඇස්තමේන්තු පිළියෙල කිරිමට පෙර නිර්මාණ සකස් කර අනුමැතිය ලබාගත යුතු වේ. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු ඇති නොවිමට වගබලා ගනිමි. |

4. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

--------------------------------------.

4.1 අභ්‍යන්තර විගණනය

-----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන වැඩ සටහනක් පිළියෙල කර තිබුණත් ඒ අනුව අභ්‍යන්තර විගණනය ක්‍රියාත්මක කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන වැඩ සටහන අනුව විගණන වැඩ සටහන් ක්‍රියාත්මක කලයුතු වේ. | ඉදිරියේදී නිවැරදිව කටයුතු කරමි. |

4.2 පළාත් ගිණුම් කාරක සභාවේ තීරණ ක්‍රියාත්මක නොකිරිම

---------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 ජුනි 26 දින පැවති පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් 2011 විගණකාධිපති වාර්තාවේ 2.3 , 2012 විගණකාධිපති වාර්තාවේ 2.5 (ඇ) (i) හා (ii) , 2.6 හා 2013 විගණකාධිපති වාර්තාවේ 1.1.2 ජේද සම්බන්ධයෙන් දී තිබූ නියෝග 2019 මාර්තු 31 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | පළාත් ගිණුම් කාරක සභාවේ නියෝග ක්‍රියාත්මක කල යුතු වේ. | පළාත් ගිණුම් කාරක සභාවේ නියෝගවලට අදාල වාර්තාවක් පළාත් ගිණුම් කාරක සභාවට යැවීමට කටයුතු කරමි. |